සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2021 ජූලි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate & Personal Taxation)

2021-10-24
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**රුවන්** ශ්‍රී ලාංකිය පුරවැසියෙකු වන අතර, **සීමාසහිත ABC සමාගමේ** මෘදුකාංග ඉංජිනේරුවරයෙකු ලෙස සේවය කරයි. අභ්‍යන්තර මෘදුකාංගයක් සංවර්ධනය කිරීමට මාස 3 ක කාලයක් සඳහා **සීමාසහිත ABC සමාගමේ** සිංගප්පූරුවේ පිහිටි පරිපාලිත සමාගමක් වෙත 2020 අගෝස්තු 29 දින ඔහුව යවන ලදී. 2020 දෙසැම්බර් 02 දින ආපසු ශ්‍රී ලංකාවට පැමිණීමට ඔහු සැලසුම් කර තිබුණ ද කොවිඩ්-19 (COVID-19) සංචරණ සීමා හේතුවෙන් ඔහුට ශ්‍රී ලංකාවට පැමිණීමට හැකි වූයේ 2021 මාර්තු 14 වනදාය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව, 2020/21 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා **රුවන්ගේ** වාසික තත්ත්වය **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත MSL ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගම,** ඇඟළුම් නිෂ්පාදන ව්‍යාපාරයේ නිරතව සිටියි. මානව සම්පත් වාර්තාවන් අනුව, 2020/21 තක්සේරු වර්ෂය තුළදී සමාගමේ සේවක සංඛ්‍යාව 120 ක් වූ අතර, සේවකයෙකුගේ මාසික වැටුප රු.50,000/- කට වැඩිය. මුද්දර බදු අරමුණ සඳහා සමාගම ලියාපදිංචි වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා වැටුප් ලදුපත් මත ගෙවිය යුතු මුද්දර බද්ද **ගණනය කරන්න.** (ලකුණු 03)

(b) ශ්‍රී ලංකාවේ මුද්දර බදු පනතට අනුව, මුද්දර බද්දට යටත් විශේෂිත ලියවිලි (specific instruments) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**අජිත්** කොළඹ ජීවත්වන වාසික පුද්ගලයෙකි. 2021 මාර්තු මාසය තුළදී ඔහු පහත සඳහන් ගනුදෙනු සිදුකර තිබේ:

- 2010 දෙසැම්බර් මාසයේදී රු.මිලියන 5 ක පිරිවැයකට මිලට ගත් ඉඩමක් අනුරාධපුරයේ ඔහු සතුව තිබුණි. මෙම ඉඩම 2021 මාර්තු මාසයේදී රු.මිලියන 8 කට විකුණන ලද අතර, 2017 සැප්තැම්බර් 30 දිනට මෙම ඉඩමේ වෙළෙඳපොළ අගය රු.මිලියන 6.8 ක් විය. මෙම ගනුදෙනුව මත **අජිත්** විසින් තැරැව්කාර ගාස්තු වශයෙන් රු.50,000/- ක් ගෙවන ලදී.
- ඔහු, මිල ලැයිස්තුගත නොකළ කොටස් 12,000 ක් රු.1,000,000/- කට විකුණන ලදී. මෙම කොටස් 2018 අප්‍රේල් මාසයේදී කොටසක් රු.54/- බැගින් මිලට ගෙන තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ගනුදෙනු මත, **අජිත්** විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ බද්ද **තක්සේරු කරන්න.** (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

**සීමාසහිත හරිත සමාගමේ**, වතු අධීක්ෂකයෙකු වන **සිල්වාට** 2020/21 තක්සේරු වර්ෂය තුළදී හෘද සැත්කමකට භාජනය වීමට සිදුවිය. ඔහුගේ දීර්ඝකාලීන  සේවය සළකා බලමින්, සමාගමේ සාංගමික සමාජ වගකීම් [Corporate Social Responsibilities (CSR)] අරමුදල හරහා රු. මිලියන 1.2 ක විශේෂ එකවර ගෙවීමක් සමාගම විසින් ඔහු වෙත ලබාදෙන ලදී. ඔහු ලද විශේෂ එකවර ගෙවීම 2020/21 තක්සේරු වර්ෂයේ ඔහුගේ ආදායම් බදු සඳහා යටත්වන බව **සිල්වාගේ** බදු උපදේශකවරයා විසින් ඔහුට දන්වන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත හරිත සමාගමෙන්** ලැබුණු විශේෂ එකවර ගෙවීම, **සිල්වාගේ** බද්දට යටත්වන ආදායමක් දැයි, ඔිනෑම නිශ්චිත නඩු තීන්දු ඇසුරින් **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## **B කොටස**

(මුළු ලකුණු 30)

## **05** වන ප්‍රශ්නය

**නීලා,** වාසික පුද්ගලයෙකු වන අතර, 2019/20 තක්සේරු වර්ෂය සඳහා කිසිදු කාර්තුමය වාරික ගෙවීමක් සිදුකිරීමට ඇය අපොහොසත් විය. කෙසේනමුත්, ඇය 2019/20 තක්සේරු වර්ෂය සඳහා ඇගේ ආදායම් වාර්තාව, බදු ගෙවීම ද සමඟ 2021 මාර්තු 10 දින ඉදිරිපත් කර තිබේ.

ඉහත තක්සේරු වර්ෂය සඳහා **නීලා** විසින් ගොනුකරන ලද ආදායම් බදු වාර්තාව සම්බන්ධයෙන් සහකාර කොමසාරිස්වරයා බදු විගණනයක් සිදුකරන ලද අතර, ඇය විසින් ඇතැම් ආදායම්, බදු කටයුතු සඳහා හෙළිදරව් කර නොමැති බව නිරීක්ෂණය විය. සහකාර කොමසාරිස්වරයා විසින් **නීලා** වෙත තක්සේරුවක් නිකුත් කරන ලදී.

JMC vLearning
"your virtual learning partner"

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනයන් අනුව කාර්තුමය ආදායම් බදු වාරික නොගෙවීම මත අදාල වන දණ්ඩන **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) සහකාර කොමසාරිස්වරයා විසින් **නීලා** වෙත තක්සේරුවක් නිකුත් කිරීම සඳහා වන ව්‍යවස්ථාපිත කාල කඩඉම (time bar) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) තක්සේරුවට විරුද්ධව වලංගු අභියාචනයක් සිදුකිරීමට **නීලා** විසින් සපුරාලිය යුතු කොන්දේසි හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

තොග සහ සිල්ලර වෙළදාමේ යෙදී සිටින **චින් ට්‍රේඩර්ස්** හවුල් ව්‍යාපාරයක් වේ. **රාමන්** සහ **චන්ද්‍රා, චින් ට්‍රේඩර්ස්** හි හවුල්කරුවන් වන අතර, පිළිවෙලින් 1:2 අනුපාතයට ලාභා'ලාභ බෙදා ගනු ලබයි.

2023 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය පහත දැක්වේ:

| | **රු.** |
|---|---:|
| දළ ලාභය | 54,862,000 |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම | 650,000 |
| | 55,512,000 |
| අඩු කළා: බෙදාහැරීමේ වියදම් | (12,554,000) |
| පරිපාලන වියදම් | (34,580,000) |
| **හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය** | **8,378,000** |

ඉහත ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත වියදම් අඩුකර තිබේ:

(1) **රාමන්** සහ **චන්ද්‍රා** එක් අයෙකුට රු.200,000/- ක් බැගින් වූ මාසිකව වැටුප් ලබාගෙන තිබේ.

(2) වර්ෂය තුළදී රු.46,000/- ක සංග්‍රහ වියදම් දරා තිබේ.

(3) **රාමන්** හවුල් ව්‍යාපාරයට ණය මුදලක් ලබාදී තිබෙන අතර, **රාමන්ට** රු.108,000/- ක පොලියක් ගෙවා තිබේ.

(4) හවුල් ව්‍යාපාරයේ වැඩකටයුතුවලට සහාය වීම වෙනුවෙන් **චන්ද්‍රාගේ** බිරිඳට වසරකට රු.150,000/- ක වැටුපක් ගෙවා තිබේ.

(5) ජාතික රෝහලට කළ පරිත්‍යාග රු.100,000/- කි.

අනෙකුත් සියලු වියදම් බදු සඳහා ඉඩදෙන වියදම් බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**චින් ට්‍රේඩර්ස්** විසින් 2022/23 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු හවුල් ව්‍යාපාර ආදායම් බද්ද **ගණනය කරන්න**.

(ලකුණු 10)

JMC vLearning "your virtual learning partner"

## **07** වන ප්‍රශ්නය

**සීමාසහිත රුකී (පෞද්ගලික) සමාගම,** ප්ලාස්ටික් ඇසුරුම් නිෂ්පාදනයේ යෙදී සිටින එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි. එයට විදේශීය මෙන්ම දේශීය ගනුදෙනුකරුවන් ද සිටියි.

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටා ගන්නා ලදි:

(1) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී සිදුකරන ලද විකුණුම් පිළිබඳ විස්තර පහත දැක්වේ: [එකතු කළ අගය මත බදු (VAT) රහිතව]:

| | රු. |
|---|---|
| අපනයන විකුණුම් | 24,500,000 |
| SVAT ලියාපදිංචි තැනැත්තන්ට කළ දේශීය විකුණුම් | 6,500,000 |
| අනෙකුත් තැනැත්තන්ට කළ දේශීය විකුණුම් | 124,000,000 |

(2) කාර්තුව තුළදී සමාගම පහත සඳහන් යෙදවුම් බදු ගෙවා තිබේ:

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය ආනයන මත | 7,825,000 |
| අමුද්‍රව්‍ය දේශීය ගැනුම් මත | 454,000 |
| අධ්‍යක්ෂවරයෙකු විසින් පාවිච්චි කරන ලද මෝටර් රථයක අළුත්වැඩියා වියදම් මත | 13,500 |

(3) පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද අතිරික්ත යෙදවුම් බද්ද (input VAT) රු.954,600/- කි.

(4) කාර්තුවට අදාල සියලුම සරල කරන ලද එකතු කළ අගය මත බදු [Simplified VAT (SVAT)] බැර වවුචර පත් සමාගම විසින් එකතු කරගෙන තිබුණි.

(5) සමාගම මාසික එකතු කළ අගය මත බදු වාරික වශයෙන් රු.2,000,000/- ක් කාර්තුව තුළදී ගෙවා තිබේ.

(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 8% ක් ලෙස සළකන්න.)

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

JMC vLearning "your virtual learning partner"

# C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත නීට් නිෂ්පාදන (පෞද්ගලික) සමාගම,** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගමක් වන අතර, එය දේශීය වෙළෙඳපොළ සඳහා පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙහි නිරතව සිටියි.

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත නීට් නිෂ්පාදන (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

(1) සියලු වියදම් අයකිරීමෙන් සහ සියලු ආදායම් බැර කිරීමෙන් පසු 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු පෙර ශුද්ධ ලාභය රු.64,250,000/- ක් විය. 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මුළු පිරිවැටුම රු.954,600,000/- ක් විය.

(2) වෙනත් ආදායම් පිළිබඳ විස්තර:

| | **රු.** |
|---|---:|
| ලාභාංශ ආදායම (දළ) | 1,500,000 |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම  (දළ) | 2,254,000 |
| ලොරි රථය විකිණීමෙන් ලද ලාභය | 122,000 |
| | **3,876,000** |

(3) 2021 මාර්තු 31 දිනට, දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

| **වත්කම** | **මිලදී ගත් වර්ෂය** | **පිරිවැය (රු.)** |
|---|:---:|---:|
| ඉඩම | 2014/15 | 24,000,000 |
| ගොඩනැගිලි | 2015/16 | 46,000,000 |
| යන්ත්‍ර | 2016/17 | 12,450,000 |
| ලොරි රථ | 2018/19 | 8,650,000 |
| ලොරි රථය | 2020/21 | 4,320,000 |
| කාර්යාල උපකරණ | 2019/20 | 1,656,000 |
| පරිගණක | 2019/20 | 450,000 |
| පරිගණක මෘදුකාංගය | 2020/21 | 840,000 |
| | | **98,366,000** |

- 2016/17 තක්සේරු වර්ෂයේදී රු.3,250,000/- ක පිරිවැයකට මිලදී ගත් ලොරි රථයක් 2020 ජුනි මාසයේදී රු.1,200,000/- කට විකුණා තිබේ. ලොරි රථය විකිණීමෙන් ලද මුදල් ද භාවිත කරමින් නව ලොරි රථයක් වර්ෂයක් තුළදී මිලදී ගෙන තිබේ.
- සමාගම, තොග කළමනාකරණය සඳහා නව පරිගණක මෘදුකාංගයක් මිලදී ගෙන ඇති අතර, එහි පිරිවැය, වර්ෂ 6 ක කාලපරිච්ඡේදයක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

JMC vLearning "your virtual learning partner"

(4) පරිපාලන වියදම් තුළ පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.16,457,000/- කි.
- සමාගම ගංවතුරින් අනාථවුවන්ට පහසුකම් සැපයීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත රු.1,000,000/- ක් පරිත්‍යාග කර තිබේ. තවද, ජාතික වකුගඩු අරමුදලට රු.500,000/- ක් පරිත්‍යාග කර තිබේ.
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරීම රු.4,214,000/- කි.
- ලියා හරින ලද ආර්ථික සේවා ගාස්තුව (Economic Service Charge) රු.1,485,000/- කි.

(5) බෙදාහැරීමේ වියදම් තුළ පහත දෑ ඇතුළත් වේ:

- විශේෂිත ණයගැතියන් සඳහා කරන ලද ප්‍රතිපාදනය රු.3,250,000/- ක් වන අතර, ණයගැතියන්ගෙන් 2% කට සමාන වන පොදු ප්‍රතිපාදනය රු.1,300,000/- කි.
- සමාගමේ නිෂ්පාදිතයන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සිදුකරන ලද කාර්මික පර්යේෂණයක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පර්යේෂණ ආයතනයකට රු.1,500,000/- ක් ගෙවා තිබේ.

(6) පහත සඳහන් තොරතුරු ද සපයා තිබේ:

- වර්ෂය තුළදී රු.568,000/- ක් පාරිතෝෂික ලෙස ගෙවන ලදී.
- 2020/21 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් සමාගම රු.5,000,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020/21 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත නීටි නිෂ්පාදන (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම.

(b) බදු අයකළ හැකි ආදායම.

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද.

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද.

***(සැ.යු: යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.)*** (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

වාසික පුද්ගලයෙකු වන **සුරංගි**, වෘත්තියෙන් වරලත් ගණකාධිකාරිවරයෙකි. ඇය ශ්‍රී ලංකාවේ සමාගමක ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය වශයෙන් සේවය කරයි.

2022/23 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා ඇයගේ ආදායම සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) සේවා නියුක්තියෙන් ලද ආදායම:

- දළ වැටුප - මාසිකව රු.300,000/- බැගින්.
- ගමන් වියදම් දීමනාව - මාසිකව රු.50,000/- බැගින්.

- 2022 දෙසැම්බර් මාසයේදී ගෙවූ ප්‍රසාද දීමනාව - රු.300,000/-.
- වර්ෂය තුළදී, ඇයට ශල්‍යකර්මයකට භාජනය වීමට සිදුවූ අතර, සමාගමේ සියලු සේවකයන් සඳහා අදාල වන වෛද්‍ය යෝජනා ක්‍රමයක් යටතේ සමාගම විසින් රු.240,000/- ක් ප්‍රතිපූරණය කර තිබේ.
- සමාගම, ඇයගේ ජංගම දුරකතන බිල්පත් දරණ අතර, වර්ෂය තුළදී රු.24,000/- ක් ප්‍රතිපූරණය කර තිබේ.
- වර්ෂය තුළදී, ඇය ඉන්දියාවේ පැවති සමුළුවකට සමාගම වෙනුවෙන් සහභාගී වූ අතර, රු.500,000/- ක් වූ ගුවන් ටිකට්පත් සහ නවාතැන් වියදම් සමාගම විසින් ප්‍රතිපූරණය කරන ලදී.
- වර්ෂය සඳහා අත්තිකාරම් පුද්ගල ආදායම් බදු [Advance Personal Income Tax (APIT)] වශයෙන් අඩු කරන ලද බද්ද රු.90,720/- කි.

(2) 2021 ජනවාරි 15 දින සිට **සුරංගි** ඇගේ ස්වාමිපුරුෂයාගේ නිවසේ ජීවත් වේ. අභිනවයෙන් ඉදිකරන ලද මහනුවර පිහිටි නිවසක් ඇයට හිමි අතර, එය නිවාඩු නිකේතනයක් වශයෙන් භාවිත කිරීම සඳහා මාසිකව රු.100,000/- ක කුලියකට, සමාගමකට කුලියට ඇය ලබාදී තිබේ. මෙම නිවසේ වාර්ෂික වටිනාකම රු.1,000,000/- ක් වන අතර, 30% බැගින් වරිපනම් ගෙවනු ලබන්නේ කුලියට ගත් සමාගම (කුලීකරු) විසිනි.

(3) **සුරංගි** ට රාජ්‍ය බැංකුවක රු.1,000,000/- ක ස්ථාවර තැන්පතුවක් තිබෙන අතර, වර්ෂය තුළදී **ලද ශුද්ධ පොළිය රු. 68,400/-කි.**

(4) **සුරංගි** ලැයිස්තුගත සමාගම් කොටස්වල ආයෝජනය කර තිබෙන අතර, එම ලැයිස්තුගත කොටස් මිලදී ගැනීම සඳහා ඇය වර්ෂය තුළදී රු.900,000/- ක් දරා තිබේ. වර්ෂය තුළදී ලැබුණු ලාභාංශ පිළිබඳ විස්තර පහත දැක්වේ:

- ලැබුණු ලාභාංශවලින් ගෙවන ලද ලාභාංශ - රු.35,000/-
- උපයන ලද ලාභවලින් ගෙවූ ලාභාංශ - රු.145,000/-

(5) **සුරංගි,** දේශීය විශ්ව විද්‍යාලයක MBA උපාධියක් හදාරමින් සිටින අතර, වර්ෂය තුළදී ඒ සඳහා රු.250,000/- ක් ඇය ගෙවා තිබේ.

(6) ඇය, රු.50,000/- ක් වටිනා භාණ්ඩ ගංවතුරින් අනාථ වූවන් සඳහා පරිත්‍යාග කර තිබේ. තවද, ඇය රු.100,000/- ක් වටිනා වෛද්‍ය උපකරණ, හොරණ මූලික රෝහලේ කොවිඩ්-19 (COVID-19) වාට්ටුවට පරිත්‍යාග කර තිබේ.

(7) **සුරංගි,** 2022/23 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් රු.10,000/- ක් ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022/23 තක්සේරු වර්ෂය සඳහා **සුරංගිගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම.

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද.

(c) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද.

(d) බදු නිදහස් ආදායම, (වේ නම්).

***(සැ.යු:** යම් ආදායමක් බද්දට යටත් නොවේ නම්, ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

JMC vLearning "your virtual learning partner"

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |

JMC vLearning
"your virtual learning partner"